WWW.OLEVELAPI.COM

අවසන් සංශෝධන ඇතුළත්
කළ යුතුව ඇත.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
# ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2011

## ලකුණු දීමේ පටිපාටිය



## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## උත්තර පත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

පිළිතුරු පත් ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළයුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- උත්තර පත්‍ර ලකුණු කිරීමට රතුපාට පැන්සලක් හෝ රතු පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- සෑම උත්තර පත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී පහත සඳහන් ක්‍රමය අනුගමනය කරන්න.

1 2 3 4 5 6 7 8 9 0

- ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

### බහුවරණ උත්තර පත්‍ර - කවුළු පත්‍රය

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරුව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපීයන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලිව එය මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර √ ලකුණකින් ද, වැරදි පිළිතුර X ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා: $\frac{60}{100}$ $\frac{30}{30}$

WWW.OLEVELAPI.COM

### ව්‍යුහගත රචනා හා රචනා උත්තර පත්‍ර

- අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස්ව තබා ඇති කොටස් හෝ පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
- ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතුවේ.

කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්න පත්‍ර එකකට (ප්‍රශ්න පත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) පමණක් පෙනී සිටි අවස්ථාවක දී ඉතිරි ප්‍රශ්න පත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රයන්ට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම් නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතුය.

උදාහරණ : - මුළු ලකුණු 100

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

| අවසාන ලකුණු | මුළු ලකුණු | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |

අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා:-

කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ අදාල උත්තර පත්‍ර පැකට්ටුව I හා II සියල්ලම ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.
(උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරණ විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකැට්ටුව පමණි.)
කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍ර I හෝ II හෝ III පැකට්ටුව තුළ නොමැති අවස්ථාවක දී හා ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

කිසියම් මධ්‍යස්ථානයක සියලුම අයදුම්කරුවනට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකිය.

උදා - ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

මෙවැනි අවස්ථාවලදී

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා "අවසාන ලකුණු තීරණය කළ නොහැක" යන සටහන යොදන්න. මෙම සටහන උත්තර පත්‍රයේ මුල් පිටුවේ පහල කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳව ජ්‍යෙෂ්ඨ සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් "9" අයිටම්වල් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

මෙම ලකුණු ලැයිස්තු "9" අයිටම්වල් (9IML) කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

කොටස් සඳහා දෙන ලකුණු ඒ ඒ කොටස අවසානයේ භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න. උත්තරයකට ලැබුණු මුළු ලකුණු ලිවීමේ දී එක් එක් කොටස සඳහා ලැබුණු ලකුණු උත්තරය අවසානයේ නැවත ලියා ඒවා එකතු කොට දක්වා ඒ වටා කවයක් අඳින්න. නිදසුනක් වශයෙන් ප්‍රශ්න අංක 03 කොටස් තුනකින් යුක්ත නම් හා එක් එක් කොටසට හිමි උපරිම ලකුණු ප්‍රමාණය 05 නම්, ඒ අනුව අයදුම්කරු ලබා ඇති ලකුණු මෙසේ දක්විය යුතුය.

$$\text{i}\quad \frac{4}{5} + \quad \text{ii}\quad \frac{3}{5} + \quad \text{iii}\quad \frac{3}{5} = 3 \text{ ——— } \left(\frac{10}{15}\right)$$

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

සෑම උත්තරයකට ම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාල කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළයුතුවේ. සියල්ලම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහනක් කර අවසානයේ දී අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂකවරිව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමානදැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න ප්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න. (ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශත සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

**අවසාන ලකුණු තීරණය කිරීම**

දින පැකැට්ටුවට අදල සියලු ම උත්තර පත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තර පත්‍රවලට අදල ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :-

| (අ) | (ආ) | ඉ |
|---|---|---|
| (i) $\frac{54}{100}$ | (i) $\frac{22}{40}$ | (i) $\frac{60.5}{100}$ |
| (ii) $\frac{67}{100}$ | (i) $\frac{34}{60}$ | (i) $\frac{81}{100}$ |
| (iii) $\frac{36}{100}$ | | |
| 3 \| 157 | | 2 \| 141.5 |
| 52.33 | | 70,75 |
| 52% | 56% | 71% |

ඉහත උදාහරණවලින් දක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණ පමණක් පූර්ණ සංඛ්‍යා ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දක්වීමේ දී ඉතිරිය 05 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණ විය යුතුය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතුය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2010
## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය I, II, III

අවසාන ලකුණු ගණනය

I පත්‍රය ලකුණු 40 යි

II
1 වන ප්‍රශ්නය - ලකුණු 20 යි.
2 වන ප්‍රශ්නය - ලකුණු 25 යි.
3 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
4 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
5 වන ප්‍රශ්නය - ලකුණු 15 යි ලකුණු 80 යි

III 1, 2, 3, 4 ප්‍රශ්න අනිවාර්යයි. 5, 6 සහ 7 වන ප්‍රශ්නවලින් එකකට පිළිතුරු ලිවිය යුතුය.

1 වන ප්‍රශ්නය - ලකුණු 20 යි.
2 වන ප්‍රශ්නය - ලකුණු 20 යි.
3 වන ප්‍රශ්නය - ලකුණු 15 යි
4 වන ප්‍රශ්නය - ලකුණු 15 යි
5 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
6 වන ප්‍රශ්නය - ලකුණු 10 යි
7 වන ප්‍රශ්නය - ලකුණු 10 යි ලකුණු 80 යි

එකතුව ලකුණු $\frac{200}{2}$ යි

WWW.OLEVELAPI.COM

අවසාන ලකුණු | 100 |

දෙවන හා තුන්වන පත්‍රවල ලකුණු දීම.

1. කොටස් ලකුණු, දකුණු පස ඇති තීරුවෙහි ලියා දක්වන්න.

2. ඒ ඒ ප්‍රශ්නයෙහි කොටස්වලට ලද ලකුණු උත්තරයේ අග ලියා එකතු කොට එය දකුණු පස තීරුවේ ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා :- $\frac{4}{8}$ $\frac{6}{12}$ $\frac{3}{5}$ (2 - $\frac{13}{25}$)

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**අවසාන ලකුණු ඇතුලත් කිරීම.**

රතු ලකුණු ලැයිස්තු යොදා ගන්නා විට එහි දක්වෙන මුළු ලකුණු වන 300 යන්න වෙනස් කොට 200 සේ ලියා ගන්න.

**රතු ලකුණු ලැයිස්තු නොමැති විට අවසාන ලකුණු ඇතුලත් කිරීම.**

i ,ii යන පත්‍රවල ලකුණු ඇතුලත් කිරීම සඳහා යොදා ගත යුත්තේ තුන්වන පත්‍රය සඳහා ඇති ලකුණු ලැයිස්තුව ය.

ලකුණු ලැයිස්තුවේ දක්වෙන අංක 12 තීරුව 3 වන පත්‍රයේ මුළු ලකුණු ගණන ඇතුලත් කිරීමට යොදා ගන්න. පත්‍ර තුනෙහි ම ලකුණුවල එකතුව එහි මුළු ලකුණු (200) තීරුවේ ද අවසාන ලකුණු (100) තීරුවේ ද සටහන් කරන්න.

**විශේෂ අවස්ථා**

තුන්වන පත්‍රය සඳහා ලකුණු ලැයිස්තු සපයා නොමැති නම් ඇගයීම් මධ්‍යස්ථානයෙන් අතිරේක ලකුණු ලැයිස්තු ලබා ගෙන III පත්‍රයේ ලකුණු එහි ඇතුලත් කරන්න.

එවැනි අවස්ථාවල දී I ,III පත්‍රවල මුළු ලකුණු II පත්‍රය සඳහා ඇති විස්තර ලකුණු ලැයිස්තුවේ ඇතුළුකොට අවසාන ලකුණු ගණන 100 තීරුවේ ලියන්න. ,

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## I පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

1. ලකුණු කිරීම සඳහා ඔබ පිළියෙල කර ගන්නා කවුළුපත ප්‍රධාන පරීක්ෂක ලවා සහතික කරවා ගන්න.

2. පළමුවෙන් ම උත්තර පත්‍රය පරීක්ෂා කර එක් එක් ප්‍රශ්නයක් සඳහා පිළිතුරු එකකට වඩා ලකුණු කොට ඇත්නම් හෝ ලකුණු කොට නැත්නම් හෝ වරණ හරහා කැපී යන සේ ඉරක් අඳින්න.

3. සෑම උත්තරයක් ම හරි බව හෝ වැරදි බව හෝ පැහැදිලිව ම අදාළ ප්‍රශ්න අංකය මත ම ලකුණු කරන්න.

4. අපේක්ෂකයා ලකුණු කර ඇති පිළිතුරු මත හරි වැරදි ( √ / x ) ලකුණු යොදමින්න.

5. කවුළු පතේ ප්‍රශ්න අංක තීරය කවුළුවක් වන සේ කපා හැර එම තීරුවෙහි ම හරි හෝ වැරදි බව දක්වන්න.

6. කවුළු පතක් හෝ තීරු පතක් හෝ යොද ගන්නා විට නිවැරදි සිහුම ගැන විශේෂයෙන් පරිස්සම් වන්න.

7. එක් එක් තීරුවෙහි නිවැරදි උත්තර සංඛ්‍යාව පහළට එකතු කොට ඒ ඒ තීරුවේ ම යටින් ලියා ඒවා එකතු නිවැරදි පිළිතුරු ගණන $\frac{x\,x}{40}$ යි. ලකුණු පස අදළ කොටුව තුළ ලියන්න.

8. ලකුණු එකතු කිරීම, එම මුළු ලකුණු 3 වන පත්‍රයේ සටහන් කිරීම යන අවස්ථාවල දී බෙහෙවින් පරීක්ෂාකාරී වන්න.

9. ආදී ලකුණකින් උත්තර ලකුණු කර තිබුණ ද, උත්තර දීම සඳහා විශේෂ පත්‍රිකාව භාවිත නොකොට ප්‍රශ්න පත්‍රයෙහි ම ඉරි ඇඳීම ආදී වශයෙන් ලකුණු කොට තිබුණ ද පිළිගන්න.

---

## II, III පත්‍රය ලකුණු කිරීම සඳහා උපදෙස්

1. උත්තර පත්‍ර ඇගයීම් ආරම්භ කිරීමට පෙර එක් එක් ප්‍රශ්නයකින් තක්සේරු කිරීමට අපේක්ෂා කරන හැකියාව කවරේ දැයි හොඳින් අවබෝධ කර ගත යුතුය.

2. එම හැකියා සම්බන්ධයෙන් අපේක්ෂකයා ප්‍රදර්ශනය කළයුතු ප්‍රවීණතා මට්ටම කුමක් ද යන්න අනුහුරු අභ්‍යාස කිරීමේ අවස්ථාවේදීත් ලකුණු දීමේ පටිපාටිය සාකච්ඡා කරන අවස්ථාවේදීත් පැහැදිලිව හඳුනා ගැනීම අවශ්‍ය වේ. මෙහි දී ප්‍රදර්ශනය විය යුත්තේ 11 වන ශ්‍රේණියේ අවසානයේ දී අපේක්ෂකයා ළඟා විය යුතු ප්‍රාප්ති මට්ටම ය. එහි දී ගුරුවරයෙකු වශයෙන් ඔබ සතු අත්දැකීම් ද ඔබගේ ප්‍රධාන පරීක්ෂකවරයා විසින් දෙනු ලබන උපදෙස් හා මග පෙන්වීම ද බොහෝ සේ ප්‍රයෝජනවත් වනු ඇත.

3. ලකුණු පැවරීමේ දී පරීක්ෂකවරුන් අතර සංගත බවක් තිබිය යුතුය. එකම උත්තරයකට පරීක්ෂකවරුන් කිහිප දෙනෙකු විසින් පවරනු ලබන ලකුණු අතර විශාල වෙනස්වීම් ඇතිවීම වළක්වා ගත යුතුය. මේ සඳහා පහත සඳහන් ක්‍රියා මාර්ග අනුගමනය කිරීම මැනවි.

   (අ) ඉදිරිපත් කොට ඇති ලකුණු දීමේ පටිපාටිය එලෙස ම අනුගමනය කිරීම.

   (ආ) ප්‍රධාන පරීක්ෂකගේ උපදෙස් නිවැරදි ව වටහා ගෙන ඒවා ක්‍රියාත්මක කිරීම.

   (ඇ) විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති අත් පොතෙහි සඳහන් ශිල්පීය ක්‍රම ඒ අයුරින් ම භාවිත කිරීම.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM





ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 | S | I,II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2011 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2011 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2011

| | |
|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය I,II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் I,II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature I,II | Three hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** හිමි වේ.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළ අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

1. ඔවුහු මිල අධික ගාමින් සමග හරි **මිනිය හරසර ගැබ්බට** බොහෝ වෙහෙසෙන්දෝ උත්සාහ ගත්හ.
   (1) වැඩිපුර භාණ්ඩ විකුණා ගැනීමට
   (2) නොසිඳී ලෙස තම ප්‍රාණය බේරා ගැනීමට
   (3) තම භාණ්ඩ සම්පූර්ණයෙන් ම පුරවා ගැනීමට
   (4) ව්‍යාපාර සඳහා වැඩිපුර මුදල් යෙදවීමට

2. තම පෝෂකයාට **අකටයුත්තක් කිරීමට**, පෝෂ්‍යයා තුළ අදහසක් නැති බව පෙන්නුම් වැටහෙන්නට විය.
   (1) යහපතක්
   (2) ආධාරයක්
   (3) අවැඩක්
   (4) අත්උදව්වක්

3. ඔහු තමන්ට පැවරූ කාර්යයෙහි **ඉස්පාසුවක් නොමැතිව** නිරත වූව ද, නිතර ම සිනාමුසු මුහුණින් යුතුව සිටියේ ය.
   (1) අවිවේකීව
   (2) සෙමින්
   (3) නිහඬව
   (4) ඉක්මනින්

4. හොඳ හොඳ තනතුරු ලැබීමත් සමග ඔහුගේ **ඔළුව ඉදිමී** ඇති බව සෙසුයෝ පැවසූහ.
   (1) හිසෙහි රෝගයක් හැදී
   (2) අහංකාරයට පත් වී
   (3) තනතුරෙන් උසස් වී
   (4) හිස අවුල් වී

- අංක 5 සිට 8 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

5. වැලිවිටියේ ශ්‍රී සෝරත හිමිපාණන් විසින් රචිත ග්‍රන්ථවලින් එතුමන්ගේ ..................... මනාව පෙනේ.
   (1) පෞරුෂය
   (2) [illegible]
   (3) පාණ්ඩිත්‍යය
   (4) අභිමානය

6. ..................... යන්න දේදුන්නට පර්යාය වචනයකි.
   (1) කුසුම්සර
   (2) සුරම්
   (3) මිහායෝන්
   (4) ඉඳුවැව

7. ශුන්‍යතාවයේ ප්‍රස්තාවනාව තුළ ම එහි ..................... අන්තර්ගත කොට ඇත.
   (1) රසාස්වාදය
   (2) මූලාධාරය
   (3) පූර්විය
   (4) විභාගමානය

8. ආචාර්ය ඊ.ඩබ්ලිව්. අදිකාරම් මහතා ..................... ම ජනතා මුහුණතට ප්‍රමුඛ වූ මානව රත්නයක් විය.
   (1) අනාගාරිකයෙන්
   (2) නිසර්ගයෙන්
   (3) නිස්සරණාධ්‍යාශයෙන්
   (4) පර්ව්‍යපකාරයෙන්

[ දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

9. අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.
(1) අදර, අදහස්, අදිසි, අදිසි (2) අලකු, අලත, අලාභ, අලෙවි
(3) කොච්චි, කොට්ටු, කොටස්, කොතැම්බුරු (4) සහමිල්, සහසිලිය, සහවනු, සස්නාන

10. අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) පාසලේ සියළු සිසුහු පුස්තකාලය අසළට රොක් වූහ.
(2) රැකියාව සඳහා ආකර්ශණීය දීමනා ඇතුළත් සිත් ගන්නා සුළු වැටුපක් දෙනු ලැබේ.
(3) කේ. ජයතිලක මහතාගේ විශිෂ්ට බුද්ධි ප්‍රභාවත්, දෙනවත්තාවයත් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රය එකලු කළේ ය.
(4) සභාවේ සියලු දෙනාගේ ම හඬ අභිබවමින් ලේඛම්වරයා ස්තුති කතාව ඉදිරිපත් කළේ ය.

11. අර්ථයෙන් විරුද්ධ පද දෙකක් එකතු වී සැදෙන යුගල පදයක් ඇතුළත් **නොවන පද පේළිය** තෝරන්න.
(1) අයවැය, පිටත්වීත්, උඩබිම, පිංපව් (2) ලාභාලාභ, කොටමිට, හොඳනරක, ඇතමැත
(3) ගුණාගුණ, එහාමෙහා, පොහොසත, කැමිබිම (4) උස්මිටි, මඩමොඩ, යාමිරම්, ඇත්තනැත්ත

12. එක් එක් පේළියේ මුලින් දක්වෙන පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) ආවතේව - උපස්ථාන, වත්පිළිවෙත්, උවටැන්, වතාවත්
(2) උද්දාමය - ආනන්දය, ප්‍රමෝදය, ප්‍රහර්ෂය, සොම්නස
(3) ධ්වනිය - නාදය, ශබ්දය, ඝෝෂය, රාවය
(4) මුහුණ - වත, වුවන, මුව, වක්ත්‍රය

13. එක් එක් පේළියේ මුලින් දක්වෙන පදයට **විරුද්ධාර්ථයක් දෙන** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) දීන - නියාලු, බයාදු, යටහත්, පරාධීන (2) කය - ගත, සිරුර, වෙර, ඇඟ
(3) ශිෂ්‍ය - ගෝල, ඡාත්‍ර, සිසු, ශිෂ්ට (4) බහුශ්‍රැත - උගත්, වියත්, පැසුණු, අව්‍යක්ත

- අංක 14 හා 15 වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත වාක්‍යාංශ සඳහා යෙදිය හැකි තනි පදය තෝරන්න.

14. තෙරම්බල **මඩෙහි උපදින** අලංකාර පුෂ්පයකි.
(1) පංකජ (2) අණ්ඩජ (3) ජලජ (4) කණ්ඩජ

15. **රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව** නැති අය පෙරස්සම් විය යුතුයි.
(1) ප්‍රතිජීවකය (2) ප්‍රතිශක්තිය (3) ප්‍රතිනිර්මාණය (4) ප්‍රතිචක්‍රීකරණය

- අංක 16 සිට 19 තෙක් වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස් කවර ව්‍යාකරණ ප්‍රවර්ගයකට අයත් දැයි තෝරන්න.

16. සිව්වතුට හොඳුවැනි වන උදාර සේවයක් කළ ඒ.එන්.එස්. කුලසිංහ මැතිඳු **ආදර්ශවත්** මිනිසෙකි.
(1) තද්ධිත (2) කෘදන්ත (3) නිපාත (4) සර්වනාම

17. **අද** වැසි සහිත දිනයකි.
(1) තද්ධිත (2) කෘදන්ත (3) නිපාත (4) සමාස

18. රිය අනතුර දුටු අය එතැනට **වේගයෙන්** දිව ගියෝ ය.
(1) නාම විශේෂණ (2) ක්‍රියා විශේෂණ (3) සර්වනාම (4) කෘදන්ත

19. විවිධ ප්‍රසංගය සඳහා දිවා රාත්‍රී දෙකෙහි ම **ඔවුහු** වෙහෙස වූහ.
(1) ජාතිනාම (2) සර්වනාම (3) තද්ධිතනාම (4) ගුණනාම

- අංක 20 සිට 22 තෙක් ඇති ප්‍රස්තාව පිරුළු සඳහා **වඩාත් ගැළපෙන** අදහස ඇති වරණය තෝරන්න.

20. නියර බිඳි තැනින්නු වතුර බසින්නේ
(1) විපතක් සිදුවන අවස්ථාවල දී ඒ ගැන නොසිතා විනෝද වීම
(2) කිසියම් වැරැද්දක් වූ විට එය අහිංසක මිනිසුන් මත පැටවීම
(3) නොලැබෙන දෙයක් වෙනුවෙන් තමා අත ඇති දේ විනාශ කර ගැනීම
(4) අවස්ථානුකූල ව ගැළපෙන පරිදි කටයුතු කිරීම

21. සිහන්නාගේ පාත්තරේට කොහොඹුරා වැටුණා වගේ
(1) එක් කරදරයකට පත්ව සිටින්නකු තවත් කරදරයකට පත් වීම
(2) අහිංසක පුද්ගලයකුට වටිනා දෙයක් ලැබීම
(3) සිහන්නාගේ ආහාරයට තවත් පුද්ගලයකු එකතු වීම
(4) කරදරයකට පත්ව සිටින්නකුට ඉන් මිදීමට මගක් පෑදීම

[ තුන්වැනි පිටුව බලන්න

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

22. පතිත පිළවුන්ට ඉනිමං බැන්ද වගේ
(1) තමන් කළ වැරැද්දකට තමන් ම දඬුවම් කර ගැනීම
✓(2) වැරදි දේ දක දක එම වැරදිවලට අනුබල දීම
(3) ඉහළින් යන සතුන්ට ආධාරකයන් සැපයීම
(4) කෙනෙකු යම් විපතක් කිරීමට සූදානම් වීම

23. **වැද්දිය - අභිවැද්දිය** යන වචන යුගලයෙහි දෙවන වචනය, පළමුවන වචනයෙහි
(1) අර්ථයට සමාන වේ. (2) අර්ථයට විරුද්ධ වේ.
✓(3) අර්ථය වැඩි කරයි. (4) අර්ථය අඩු කරයි.

24. පහත දැක්වෙන වාක්‍යයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත වචන අයත්වන ක්‍රියාපද වර්ග අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
හිරු **බැස යද්දී** කාන්තා කුඹුරෙන් ගොඩට **පැමිණ** අම්මා සමග **කතාකරමින්** නිවස දෙසට **ගියේ** ය.
(1) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(3) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
✓(4) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා

25. නොයෙක් සහ මාර්ගෝපදේශ යන වචන දෙක ම නිවැරදි ලෙස විසන්ධි කර ඇති වරණය තෝරන්න.
✓(1) නො + එක්, මාර්ග + උපදේශ (2) නොය + එක්, මාර්ග + උපදේශ
(3) නො + එක්, මාර්ගෝ + පදේශ (4) නොයෙ + ක්, මාර්ගෝප + දේශ.

26. පංචේන්ද්‍රියයන්ට අරමුණු වන විවිධ අවස්ථා හා සිදුවීම් සිතට නගා වැඩී, නව සංකල්ප රූප මතු වීම හැඳින්වෙන්නේ,
(1) උපමාලංකාරය නමිනි. ✓(2) පරිකල්පනය නමිනි.
(3) වාක් විචිත්‍රත්වය නමිනි. (4) උත්ප්‍රාසය නමිනි.

- අංක **27** හා **28** ලිඛිත ව්‍යවහාරයට හැරවූ විට **වඩාත් නිවැරදි** වාක්‍යය ඇති වරණය තෝරන්න.

27. ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්ති වගේ පණ්ඩිතයෝ සිංහල සාහිත්‍යයට ලොකු සේවයක් කළා.
(1) සිංහල සාහිත්‍යයට ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්ති වැනි පඬිවරුන් සුවිසල් සේවයක් ඉටු කළේ ය.
(2) ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්ති වැනි පඬිවරුන් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයට වටිනා මෙහෙයක් ඉටු කළහ.
✓(3) ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්ති වැනි පඬිවරු සිංහල සාහිත්‍යයට සුවිසල් මෙහෙයක් ඉටු කළහ.
(4) සිංහල සාහිත්‍යයේ පෝෂණයට ගුරුළුගෝමී, විද්‍යාචක්‍රවර්ති වැනි පඬිවරුන් වටිනා මෙහෙයක් ඉටු කරන ලදහ.

28. ලංකාවේ ඉංජිනේරු මහත්තුරු කම්කරුවොත් එක්ක හරි හරියට පාලමේ වැඩ ඉවර කළා.
✓(1) ශ්‍රී ලාංකික ඉංජිනේරුවෝ කම්කරුවන් සමග එකතු වී පාලමේ වැඩ නිම කළහ.
(2) ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් කම්කරුවන් සමග එක් වී පාලමේ වැඩ නිම කළහ.
(3) ශ්‍රී ලාංකික ඉංජිනේරුවරුන් ද කම්කරුවෝ ද එකට එකතු වී පාලමේ වැඩ අවසන් කළහ.
(4) ශ්‍රී ලාංකික ඉංජිනේරුවෝ ද කම්කරුවෝ ද එකතු වී පාලමේ වැඩ නිම කළේ ය.

29. **දෙතිත හා යුගල උඩුකොමා** යන විරාම ලක්ෂණ යෙදෙන අවස්ථා දෙකක් අනුපිළිවෙළින් දක්වෙන වරණය තෝරන්න.
(1) නිදර්ශන දක්වන අවස්ථාවල, යම් වචනයක් හෝ කරුණක් හෝ අවධාරණය කර පෙන්වන අවස්ථාවල
✓(2) නිදර්ශන දක්වන අවස්ථාවල, ප්‍රත්‍යක්ෂ භාෂණ දක්වන අවස්ථාවල
(3) ප්‍රත්‍යක්ෂ භාෂණ දක්වන අවස්ථාවල, යම් අදහසක් විශේෂ කරනයෙන් දක්වන අවස්ථාවල
(4) වාක්‍ය අවසන් කරන අවස්ථාවල, ප්‍රත්‍යක්ෂ භාෂණ දක්වන අවස්ථාවල

30. පහත සඳහන් ගීත ඛණ්ඩයේ ඇති **රූපක දෙකක්** ඇතුළත් වන වරණය තෝරන්න.

ගමට කලින් හිරු මුළු තැන් ගෙට වඩිනා
ඒ හිරු එළියේ නැණ මල් පොඩි පිපුණා
ඒ මල් සුවඳේ අද ලොව්තුරු සුව විඳිනා
කලා වැවේ නිල් දියවර අපෙ අම්මා

(1) හිරු එළිය, නැණ මල් පොඩි
(2) හිරු එළිය, මල් සුවඳ
✓(3) නැණමල් පොඩි, කලා වැවේ නිල් දියවර අපෙ අම්මා
(4) ලොව්තුරු සුව, කලා වැවේ නිල් දියවර අපෙ අම්මා

[ හතරවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- අංක 31 සිට 33 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව වඩාත් **නිවැරදි** වාක්‍යය තෝරන්න.

31. (1) සාකච්ඡාවට සහභාගි වන්නෝ ගරු මර්සලින් ජයකොඩි පියතුමාණෝ ය.
(2) රාජ්‍ය සාහිත්‍ය උත්සවයේ සම්මාන ලබන්නෝ ලේඛකයන් ය.
(3) වේදිකාවේ ගී ගයන්නේ ගායකයෝ ය.
(4) වචන්නන් දිනත්තෙන්ය යන කියමනත් අප අතර පවතී.

32. (1) සියලු සත්ත්වයෝ සුවපත් වේවා !
(2) ලෝක වාසීහු නිරෝගී වෙත්වා !
(3) අපි නිදුක් වෙත්වා !
(4) දරුවන් ලෝකයාගෙන් කරුණාව හා ආදරය ලබත්වා !

33. (1) මිනු ද මම ද උත්සවයට සහභාගි වන්නෙමු.
(2) ප්‍රධාන අමුත්තෝ ද උත්සවයට සහභාගි වෙති'යි අපි සිතුවෙමු.
(3) නාවලෙක්ව සිටි ජෝ අබේවික්‍රම මහතා පසුව ලේඛකයෙකු ද විය.
(4) ඇතැම් පියදුරෝ වාහන පදවන විට මාර්ග නීති නොපිළිපදින්නේ ඇයි?

- අංක 34 සිට 36 තෙක් ඇති ප්‍රශ්නවල මුලින් දී ඇති වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය සහිත වාක්‍යය තෝරන්න.

34. සංවර්ධනය වෙමින් පවතින රටවල පොදු ජනතාවට අලුත් ම විද්‍යාත්මක සිදුවීම් ගැන දත යුත්තට සැලැස්වීමේ බලවත් අවශ්‍යතාවක් තිබේ.
(1) විද්‍යාවේ ඇතිවන නව ප්‍රවණතා පිළිබඳ ව සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාව දැනුවත් කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී.
(2) නව විද්‍යාත්මක ප්‍රවණතා පිළිබඳ ව අනිවාර්යයෙන් දැනගත යුත්තේ සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාවයි.
(3) සංවර්ධනය වන රටවල ජනතාව විද්‍යාවේ නව ප්‍රවණතා පිළිබඳ ව දැනුවත් වීම අවශ්‍ය වේ.
(4) සංවර්ධනය වෙමින් පවතින රටවල ජනතාව විද්‍යාත්මක නව සංකල්ප පිළිබඳ ව දැනගෙන සිටීම අනිවාර්ය අවශ්‍යතාවකි.

35. රටක යටිතල පහසුකම්වල සංවර්ධනයක් සිදු වී තිබීම එරට සමෘද්ධිමත්භාවයේ එක් සංකේතයක් වශයෙන් සැලකිය හැකි ය.
(1) රටක් සංවර්ධනය වන්නේ එරට යටිතල පහසුකම් තිබුණොත් පමණි.
(2) රටක සංවර්ධනයේ ප්‍රධාන ලක්ෂණය වනුයේ යටිතල පහසුකම් දියුණු වී තිබීම ය.
(3) රටක යටිතල පහසුකම් දියුණු වී තිබීම එරට සංවර්ධනයේ ලක්ෂණයකි.
(4) යටිතල පහසුකම් දියුණු කිරීමෙන් රටක් සංවර්ධනය කළ හැකි ය.

36. අර්ථවත් විචාරයක් උදෙසා කාව්‍යයේ භාෂාව වැදගත්වන බව ඇතැම් අපරදිග විචාරකයන්ගේ මතයයි.
(1) විචාරය උදෙසා කාව්‍යයේ භාෂාව වැදගත් වන බව විචාරකයෝ පවසති.
(2) අපරදිග විචාරක මතය වන්නේ අර්ථවත් වූ විචාරයක් සඳහා කාව්‍යයේ භාෂාව ඉතා වැදගත් වන බවයි.
(3) කාව්‍යයේ භාෂාව අර්ථවත් විචාරයකට අත්‍යවශ්‍ය බව අපරදිග විචාරක මතයයි.
(4) අර්ථ සම්පන්න විචාරයකට කාව්‍යයේ භාෂාව වැදගත් වන බව අපරදිග සමහර විචාරකයෝ පවසති.

37. පහත දැක්වෙන වාක්‍යයේ **තද කළු අකුරෙන්** මුද්‍රිත පදයේ අදහස දැක්වෙන වරණය තෝරන්න.
රාජසිංහයන්ගේ රාජ්‍ය පාලන කාලය **සශ්‍රීක යුගයක්** විය.
(1) විදේශ ආක්‍රමණ පැවැති යුගයකි.
(2) ඉතා ම සමෘද්ධිව පැවැති යුගයකි.
(3) දැඩි නියඟයක් පැවැති යුගයකි.
(4) දැඩි අවුල් වියවුල් සහිත යුගයකි.

38. 'හිවැල් මොරටද කිත හාරන උරෙන්ට' යන පද්‍ය පාදයේ **හිවැල්** යනු
(1) නගුලට සම්බන්ධ කොටසකි.
(2) වනාන්තරයේ වැවෙන වැල් විශේෂයකි.
(3) උරන්ගේ ශරීරාංගයකි.
(4) රෑහැලයේ කොටසකි.

39. අතීතයේ පටන් ශ්‍රී දළදා මාලිගාවේ සිදු කරනු ලබන විශේෂ පූජා ක්‍රමයක් **නොවන්නේ**,
(1) නානුමුර මංගල්‍යය ය.
(2) කාර්තික මංගල්‍යය ය.
(3) අලුත් සහල් මංගල්‍යය ය.
(4) පෝණ මංගල්‍යය ය.

40. 'මිහකල් තාමිලපුල් වන මිණි ගණ පෙනිණි' යන පද්‍යපාදයේ අදහස නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.
(1) සිත් ඇදගන්නා පොළොව, මාතෙල් වන නාමැති මාණික්‍ය සමූහය පෙනිණි.
(2) සිත් ප්‍රබුද්ධ කරන පිපුණු නෙළුම් වනයක් මෙන් මැණික් සමූහය පෙනිණි.
(3) මනස්කාන්ත වූ මාතෙල් සහ නිල් යන මැණික් සමූහය පෙනිණි.
(4) වනයේ ඇති සිත් ඇදගන්නා මැණික් මෙන් නෙළුම් හා මාතෙල් පෙනිණි.

* *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## இலங்கைப் பரீட்சைத் திணைக்களம்
## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
## தேசிய மதிப்பீட்டிற்கும் பரீட்சித்தலுக்குமான சேவை
## අ.පො.ස. (සා.පෙළ) විභාගය 2011
## க.பொ.த.(சா.தர)ப் பரீட்சை 2011

විෂයය / பாடம் : සිංහල භාෂාව හා සාහිත්‍යය

විෂයය අංකය / பாட இலக்கம் : 21

### ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය
### புள்ளி வழங்கும் திட்டம் - பத்திரம் I

| ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை | ප්‍රශ්න අංකය / வினா இல | පිළිතුර / விடை |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 3 | 21. | 1 | 31. | 1, 2 |
| 02. | 3 | 12. | 3 | 22. | 2 | 32. | 2 |
| 03. | 1 | 13. | 4 | 23. | 3 | 33. | 1 |
| 04. | 2 | 14. | 1 | 24. | 4 | 34. | 1 |
| 05. | 3 | 15. | 2 | 25. | 1 | 35. | 3 |
| 06. | 4 | 16. | 1 | 26. | 2 | 36. | 4 |
| 07. | 2 | 17. | 3 | 27. | 3 | 37. | 2 |
| 08. | 4 | 18. | 2 | 28. | 1 | 38. | 1 |
| 09. | 1 | 19. | 2 | 29. | 2 | 39. | 4 |
| 10. | 3 | 20. | 2 | 30. | 3 | 40. | 1 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු 01 x 40 = 40

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## II පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රයේ අරමුණ වී ඇත්තේ අපේක්ෂකයා සතු

i. ලිවීමේ කුසලතා ඇගයීම
ii. කියවීමේ කුසලතා ඇගයීම

(i) ලිවීමේ කුසලතාවල දී අවධානය යොමු කර ඇත්තේ භාවිතය විශ්ලේෂණය හා සංශ්ලේෂණය යන හැකියා තක්සේරු කිරීමටයි. දෛනික කාර්යයන්හි දී භාෂාව ප්‍රායෝගික ව යොදා ගැනීමට අපේක්ෂකයාට ඇති හැකියාව විමසීම කෙරෙහි විශේෂ අවධානය යොමු කර ඇත.

එහි දී භාෂාව ප්‍රායෝගික ව පරිහරණය කිරීමටත්, අවස්ථානුරූපී ව ගැළපීමටත්, නිවැරදි ව භාවිත කිරීමටත් ඇති හැකියාව ඇගයීමට ලක් කෙරේ.

භාවිතය යන්නෙන් අදහස් කෙරෙන්නේ උගත් මූල ධර්ම අලුත් අවස්ථාවක දී නිවැරදි ව ප්‍රයෝජනයට ගැනීමයි. අක්ෂර වින්‍යාසය, පද බෙදා ලිවීම, උක්තාඛ්‍යාත පද සම්බන්ධය, ආකෘතිය ආදිය පිළිබඳ මූල ධර්ම අලුත් අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීම භාවිතය පිළිබඳව දැක්විය හැකි උදාහරණයකි.

විශ්ලේෂණය යන්නෙන් අදහස් කෙරෙන්නේ කිසියම් අදහසක් හෝ සිද්ධියක් හෝ ඉදිරිපත් කර ඇති කල්හි එහි සමස්තය ඇසුරින් කොටස් විග්‍රහ කොට බැලීම හා සමස්තය තුළ ඇති විවිධ උප කොටස් හඳුනා ගැනීමයි. එසේ ම උප කොටස් අතර සම්බන්ධය දැකීම යි.

සංශ්ලේෂණය යන්නෙන් අදහස් කරන්නේ කිසියම් සමස්තයක් ගොඩනැඟීමේ හැකියාවයි. ඡේදයක විවිධ අනු කොටස් හඳුනා ගෙන, ඒ අනු කොටස් අතර නිවැරදි සම්බන්ධය පවත්වා ගනිමින් අලුත් යමක් නිර්මාණය කිරීමයි.

(ii) කියවීමේ කුසලතා ඇගයීමේ දී අවධානය යොමු කළ යුත්තේ අලුත් කොටසක් කියවා එහි ප්‍රධාන අදහස් වටහා ගැනීම, එහි එන යෙදුම්වලින් ප්‍රකාශ වන විවිධ අරුත් තේරුම් ගැනීම, එහි එන සමහර වචනවල අරුත් අවබෝධ කර ගන්නා අයුරු විමසීම වැනි කරුණු කෙරෙහිය.

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය - II පත්‍රය

* ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

**ප්‍රශ්න අංක - 01** **මුළු ලකුණු 20 යි.**

**අපේක්ෂණය** **භාෂා පරිචය ඇගයීම**

**මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.**

**අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20 කි.**

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන පහත සඳහන් අක්ෂර කාණ්ඩ **දෙක** නම් කරන්න.
(අ) ඞ, ඤ, ණ, න, ම (ආ) ත, ථ, ද, ධ, න

(ii) (අ) සහ (ආ) වාක්‍යවල යෙදී ඇති **ගත** යන වචනයට තේරුම් දෙකක් ඇත. ඒ තේරුම් **දෙක** පමණක් වෙන් වෙන් ව ලියන්න.
(අ) **ගත** සිත සංවර කර ගනු පිණිස ඇය භාවනාවට යොමු වූවා ය.
(ආ) එම **ගත** කෝට්ටේ යුගයට අයත් වූවකි.

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. **එම වචන දෙක පමණක් නිදොස් කර** ලියන්න.
ශ්‍රී ලංකාවේ ඖෂද භාවිතය සීග්‍රයෙන් ඉහළ ගොස් ඇති බව වෛද්‍ය පර්යේෂණ ආයතනය නිකුත් කළ වාර්තාවක සඳහන් වේ.

(iv) පහත දැක්වෙන එක් එක් වචන අයත්වන සන්ධි විධිය නම් කරන්න.
(අ) ජීවෝපාය (ආ) පුනරුක්තිය

(v) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය දෙක **කර්මකාරක** වාක්‍ය බවට හරවා ලියන්න.
(අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති. (ආ) ආදි සිංහයෝ අප පිළිගත්හ.

(vi) පහත දැක්වෙන (අ), (ආ) යෙදුම්වල පළමුවන වචනය සමඟ දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වචන ගැළපෙන සේ පළමුවන හෝ දෙවන හෝ වචනය සකස් කර ලියන්න.
(අ) විදෙස් ප්‍රවෘත්ති (ආ) වර්ෂා කල

(vii) පහත දී ඇති කවි පේළි දෙකෙහි තද කළ අකුරෙන් දැක්වෙන **ක්‍රියා වර්ගය** නම් කරන්න.
(අ) "සියඹින් ගී රස විඳුරු"
(ආ) "සව යි හෙරදුය යම් පුරයට"

(viii) **'කර'** යන පදයට **'අව්'** ප්‍රත්‍යය එකතු කිරීමෙන් **'කරව්'** යන තද්ධිත පදය සෑදෙන්නාක් මෙන්,
(අ) **'ඉස'** යන පදයට **'අව්'** ප්‍රත්‍යය එකතු කිරීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?
**'සිසිල්'** යන පදයට **'අස්'** ප්‍රත්‍යය එකතු කිරීමෙන් **'සිසිලස්'** යන තද්ධිත පදය සෑදෙන්නාක් මෙන්,
(ආ) **'විරල්'** යන පදයට **'අස්'** ප්‍රත්‍යය එකතු වීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?

(ix) පහත සඳහන් වචන දෙකෙහි **අනුක්ත රූප** ලියන්න.
(අ) සත්තු (ආ) සිංහයාවන්

(x) සමන් මලෙහි සවියා හා **කුසුම** හැඳින්වීමට යොදන විශේෂිත වචන ලියන්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

WWW.OLEVELAPI.COM

අපේක්ෂිත උත්තර

i. (අ) නාසිකාක්ෂර / අනුනාසිකාක්ෂර / නාසිකාක්ෂර / අනුනාසිකාක්ෂර / නාසික / අනුනාසික / වර්ගාන්තාක්ෂර / වර්ගාන්ත / නාසික අක්ෂර / වර්ගාන්ත අක්ෂර
(ආ) දන්තජ / 'ත' වර්ගය / තවර්ගාක්ෂර

ii. (අ) ශරීරය / සිරුර / කය / ඇඟ / වෙර / ඇඟ / දේහය / කුණුවල / කය.
(ආ) ග්‍රන්ථය / පොත / පුස්තකය / කෘතිය

iii. ඖෂධ , සීඝ්‍රයෙන් අක්ෂර වින්‍යාසය නිවැරදිනම් වචනය ලියා තිබේනම් ලකුණු දෙන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

iv. (අ) ස්වරාදේශ සන්ධිය
(ආ) ආගම සන්ධිය / ස්වර සන්ධිය

v. (අ) වෛද්‍යවරුන් විසින් රෝගීහු සුවපත් කරනු ලබති. / කරනු ලබත් / කරනු ලැබෙති / කෙරෙත් / කෙරෙති.

(ආ) ආදි ශිෂ්‍යයන් විසින් අපි පිළිගැනුණෙමු / පිළිගන්නා ලදිමු / පිළිගන්නා ලද්දෙමු / පිළිගනු ලැබිමු / පිළිගනු ලැබුමු / පිළිගන්නා ලදුම්හ. / පිළිගනු ලැබුවෙමු / පිළිගනු ලදුමු / පිළිගනු ලදුම්හ / පිළිගනු ලැබූහ...

vi. (අ) විදෙස් පුවත් / විදේශ ප්‍රවෘත්ති / විදේශීය ප්‍රවෘත්ති
(ආ) වර්ෂාකාලය / වැසි කල

vii. (අ) මිශ්‍ර ක්‍රියා / මුසු කිරිය
(ආ) විධි ක්‍රියා / විධාන ක්‍රියා / විදිකිරිය

viii. (අ) ඉගාටි සංක්‍රාන්තිය නැත්නම් ලකුණු නැත.
(ආ) වරලස්

ix. (අ) සතුන්
(ආ) ශිෂ්‍යාවක

x. (අ) අඹබරුවා / ගෝල්ලු
(ආ) යතුර / යතුරු තුල්ල / කොලන්නාව

**ප්‍රශ්න අංක 02** **මුළු ලකුණු 25 යි.**

**අපේක්ෂණය** සංශ්ලේෂණ හැකියාව මැනීම.

**මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් පරීක්ෂකයාට ඉදිරිපත් කොට ඇති මඟ පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් සිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරින් වටහා ගත යුතුය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් ද ඇති විස්තරයෙන් ලබා ගත හැකිය. මාතෘකාවක් ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරින් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.**

WWW.OLEVELAPI.COM

**02.** **පහත දැක්වෙන (i), (ii), (iii), (iv) යන විස්තර අතුරින් එකක් තෝරා ගෙන, වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න.**

**පහත දැක්වෙන එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති රෝම ඉලක්කම, ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද ලියන්න.**

- **අන්තර්ගත විය යුතු කරුණු**
- **ඡේද සංඛ්‍යාව**
- **කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ**
- **යොදා ගත හැකි මාතෘකාව**

**අදිය පිළිබඳ ව මඟ පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.**

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

2. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන වචන **250** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ශ්‍රී ලංකාව ස්වභාව සෞන්දර්යයෙන් අනූන රටකි. වනාන්තර, දිය ඇලි, මුහුදු වෙරළ වැනි දර්ශනීය ස්ථානවලින් අලංකාරවත් වී ඇත. එහෙත් මේවා නැරඹීමට පැමිණෙන ජනයා විසින් ඒ ස්ථානවලට බැහැර කෙරෙන පොලිතින් හා ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය හේතුවෙන් ඒ තැන්වල සුන්දරත්වය වැනසෙමින් පවතී. මේ තත්ත්වය වළක්වාගැනීම කෙරෙහි සැමගේ අවධානය යොමු විය යුතු ය.

(ආ) අනාදිමත් කාලයක පටන් රටක පැවතගෙන එන්නා වූ ජාතික හා ආගමික උත්සව මගින් එරට සංස්කෘතියේ වැදගත් පැතිකඩක් නිරූපණය කෙරෙයි. ශ්‍රී ලාංකිකයන් අතර පැවැත්වෙන එබඳු උත්සවවල දක්නට ලැබෙන සංස්කෘතික විචිත්‍රතාව ද ඉහළ ය. ජනයා අතර සාමය, සාමූහිකත්වය හා සහජීවනය ගොඩනැඟීමට ද ඒ උත්සව මගින් මහඟු පිටුබලයක් සැපයෙයි.

(ඉ) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීමට ලොව සැම රටක් ම බැඳී සිටිය ද ළමයින් මෙහෙකරු සේවයේ යෙදවීම ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල පවතින ප්‍රබල සමාජ ගැටලුවකි. ළමා ශ්‍රමිකයන් මෙවැනි විවිධ අපයෝජනවලට ලක්වීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පුවත් නිතර වාර්තා වේ. නොයෙක් සමාජ-ආර්ථික හේතු මත උද්ගත වී ඇති මේ ප්‍රශ්නය විසඳීමට ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

(ඊ) වර්තමාන ශ්‍රී ලාංකිකයන් වැඩිදෙනාගේ ජනප්‍රියතම රූපවාහිනී වැඩසටහන බවට පත්ව තිබෙන්නේ ටෙලිනාට්‍යයි. මේවායින් බහුතරයක් කලාත්මක බවින් හීන හරසුන් ඒවා බව විචාරකයෝ පවසති. එබැවින් ටෙලිනාට්‍ය අධ්‍යාපනික, සෞන්දර්යාත්මක හා ගුණාත්මක අරමුණු සහිත සමෘද්ධ විනෝදාස්වාදාත්මක මාධ්‍යයක් බවට පත් කිරීම කාලීන අවශ්‍යතාවකි. *(ලකුණු 25 යි)*

එක් එක් විස්තරයට අදාළවන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.

(අ) ස්වාභාව සෞන්දර්යයෙන් අනූන රටක් ගොඩ නගමු

(ආ) ජාතික හා ආගමික උත්සවවලින් පිළිබිඹුවන සංස්කෘතිය හා එහි වැදගත්කම

(ඉ) අවධානය යොමුකළ යුතු ළමා අයිතිවාසිකම්

(ඊ) කලාත්මක හා ගුණාත්මක බවින් පෝෂණය විය යුතු ටෙලි නාට්‍යය

**ලකුණු විභජනය** **මුළු ලකුණු 25 යි.**

| | | | |
|---|---|---|---|
| 1. | සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව | - | ලකුණු 08 යි |
| 2. | සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වියත්වය | - | ලකුණු 12 යි |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05 යි |

**01. සාරවත්භාවය - ලකුණු 07 යි**
**විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි**

**තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව සරුබව හා සමබව, වචන ගණන 250 සමීපව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.**

**02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වියත්වය ලකුණු 12 යි**

**මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වියත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතු ය.**

**03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම ලකුණු 05 යි**

**වියරණ, අක් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.**

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාළ ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

සැලකිය යුතුයි

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200 ට වඩා අඩු වන කල්හි ඉහත දැක් වූ 1. 2. 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (×) ලකුණ යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් පැහැදිලි ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.

1. 2. 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තර අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| නිදසුන් | - | 6 | 9 | 3 | 18 |
| | | ---- | ---- | ---- | ---- |
| | | 8 | 12 | 5 | 25 |

සංලක්ෂණය : වාක්‍ය රචනය ඇගයීමට පෙර අදාළ ප්‍රශ්නය කියවා දළ සැලැස්මක් සකස්කර ගන්න. ප්‍රශ්නයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

**ප්‍රශ්න අංක - 03**

අපේක්ෂණය - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒවා ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංස්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

3. පහත දැක්වෙන පාඨය වචන **50-60** අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන ද උත්තරය අග ලියන්න.

ජනශ්‍රැති යනුවෙන් අප හඳුන්වනු ලබන ජන සම්ප්‍රදායයන් සියල්ල ඇතින් මූලිකව ම සිදු කරනු ලැබ ඇත්තේ එක් පරම්පරාවක් විසින් ලබා ගන්නා ලද සමස්ත දැනුම් පද්ධතිය ඊළඟ පරම්පරාවට සඳහා උරුම කොට දීම ය. මෙම දැනුම් සම්භාරය යනු එක අංශයක එක පැතිකඩක් පමණක් සම්බන්ධ වූ ඒවා නොවේ ය. එහෙයින් කුමන ජනශ්‍රැතියක් විශ්ලේෂණයට භාජනය කරනු ලැබුවත් යම් අංශයක් හා බැඳී දැනුම් ඒ වටා ගොනු වී ඇති බව දැකිය හැකි වනු ඇත. මින්නේරිය වැව වේවා, කලා වැව වේවා, පොරමෙර වැව වේවා ආශ්‍රය කොට ගත් ජනප්‍රවාද සලකා බැලූ කල්හි ඒවායෙහි විශිෂ්ට දැකිය හැක්කේ පැරැන්නන් වැව් බැඳීම සඳහා යෝග්‍ය ස්ථාන තීරණය කොටගැනීම පාදක කොටගත් කරුණු ය. වැව් බැඳීම සඳහා යොදාගත් තාක්ෂණික ක්‍රමවේදයන් ය. අනුගමනය කළ පිළිවෙත් ය. ඉටු කරන ලද පූද පිළිවෙත් ය. අනුරාධපුරය වේවා, පොළොන්නරුව වේවා, දඹදෙණිය වේවා, මහනුවර ඇසුරු කොටගත් ජනප්‍රවාද මගින් අපට ආරක්ෂා සහිත රාජධානි රාජකීය මාළිගාවන් ඉදි කිරීම සඳහා යෝග්‍ය තැන් සොයාගැනීමට යොදා ගත් දැනුම් සම්භාරය මෙන් ම එම නගර ඉදි කිරීම සඳහා කරන ලද සැලසුම් හා උපයෝගී කොටගත් ක්‍රමවේද පිළිබඳ අවබෝධයක් ලද හැකි ය.

(ලකුණු 10 යි)

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි.**

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි.
අන්තර්ගතය - ප්‍රධාන අදහස් සඳහා ලකුණු 05 යි.
වචන ගණන - ලකුණු 03 යි. (වචන 50 - 60 අතර තිබීම සැහේ)
ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි. (ව්‍යාකරණ, අක් අකුරු, විරාම ලක්ෂණ ආදිය)

* 65 – 45 අතර තිබේනම් ලකුණු 2යි.
45ට අඩුනම් 1යි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**අපේක්ෂිත ප්‍රධාන අදහස්.**

- ජනශ්‍රැතිය යනු පරම්පරාවෙන් පරම්පරාවට දැනුම උරුම කිරීමේ කාර්යයයි.
- සෑම ජනශ්‍රැතියක ම පාහේ යම් අංගයක් හා බැඳි දැනුම් සම්භාරය එකට ගොනු වී ඇත .
- වාපි කර්මාන්තය ආශ්‍රය කරගත් ජනප්‍රවාදවල පැරැන්නන් වැව් බැඳීමට පාදක කොටගත් කරුණු සඳහන් වේ.
- ආරක්ෂිත රාජධානි පිහිටුවා ඇත්තේ ද නගර ඉදිකිරීම සඳහා කළ සැලසුම් හා යෝග්‍ය තැන් සොයාගැනීම පිළිබඳ දැනුම තුළින් ය.
- මෙහි දී යොදාගත් තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කළ සිරිත් විරිත් ඉටුකරන ලද පුද පිළිවෙත් පිළිබඳ අවබෝධයක් ලැබේ.

**වචන ගණන 65 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 45 ට අඩු වන කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් යොදන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද වෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 80 ට වැඩි කල්හි හෝ 45 ට අඩු වන කල්හි වචන ගණන සඳහා 01 (එක) ලකුණක් ඊට තමන්න.**

**ප්‍රශ්න අංකය - 04**

**අපේක්ෂණය - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම.**

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

සාහිත්‍යය පරාර්ථය උදෙසා කැපවූවකි. සාහිත්‍යකරුවා තම අදහස් තමා තුළ ම තබා නොගෙන අනායන් වෙත පමුණුවන්නේ එහෙයිනි. මේ කාර්යයෙහි ලා කිහිදෙනෙක් දායකවෙති. ඒ ලේඛකයා, පාඨකයා හා විචාරකයා ය. ලේඛකයා තම මනසට පිවිසෙන අදහස්, අනුභූතියක් හෝ කල්පනාවක් හෝ ලේඛනගත කරයි. එම කාර්යයෙහි ලා ඔහු සතුව පවතින සියුම් බව හා පරිණත බව එක සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලීත්වය පිවිසේ. පාඨකයා තමන් සතු රුචිය හෝ සහෘදයත්වය හෝ අනුව එය කියවයි. විචාරකයා කෘතියෙහි අන්තර්ගතය පිළිබඳ විමසා බලයි. එහිදී ඊට අයත් විෂය ක්ෂේත්‍රය, භාෂාව, ශෛලිය හා ආකෘතිය වැනි ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරෙයි. විචාර කාර්යයේ දී මෙකී ලක්ෂණ පිළිබඳ ව පමණක් නොව අන්දැකීමෙන් ලබාගත් සමාජ පරිඥානය ද වැදගත් වේ. මෙකී අත්දැකීම් පසුබිමෙන් ගැනෙන්නේ පසක්කොට කියවීමෙන් නොවන්නා වූ බහුශ්‍රැතභාවය යි. බහුශ්‍රැතභාවයෙන් හීන වූ විචාරකයකුට කෘතියක් අවතක්සේරු කිරීමත් අධිතක්සේරු කිරීමත් ඉතා පහසු ය. මේ ක්‍රම දෙකෙන් ම කෘතියට සාධාරණයක් ඉටු නො වේ.

(i) සාහිත්‍යය පරාර්ථය උදෙසා කැපවූවක් බව ලේඛකයා පවසන්නේ කුමක් නිසා ද?

(ii) සාහිත්‍යකරණය උදෙසා, දායකත්වය සපයන පුද්ගලයෝ කවරහු ද?

(iii) මෙම ඡේදයේ සඳහන් පරිදි සාහිත්‍ය කෘතියකට අපූර්වත්වය හා නිර්මාණශීලීත්වය පිවිසෙන්නේ ලේඛකයා සතු කවර ගුණාංග නිසා ද?

(iv) ලේඛකයා පවසන පරිදි කෘතියක් විචාරයට ලක් කිරීමේ දී විශේෂ අවධානය යොමු කෙරෙන කරුණු මොනවා ද?

(v) කෘතියක් අවතක්සේරු කිරීමත් අධිතක්සේරු කිරීමත් සිදුවන්නේ කෙබඳු විචාරකයකු අතින් ද?

*(ලකුණු 10 යි)*

**අපේක්ෂිත උත්තර**

i. සාහිත්‍ය කරුවා තම අදහස් අන් අය වෙත පමුණුවන නිසා

ii. ලේඛකයා පාඨකයා හා විචාරකයා

iii. සියුම් බව හා පරිණත බව

iv. අන්තර්ගතය, සමාජ පරිඥානය [illegible], විෂය ක්ෂේත්‍රය, ශෛලිය, [illegible]

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(ඉහත උත්තර 2 කින් එකක් පමණක් ලියා ඇත්නම් ලකුණු 01 යි. එක් කරුණක් පමණක් විස්තර කර ඇත්නම් ලකුණු 01 යි)

v. බහුශ්‍රැත භාවයෙන් හීන වූ විචාරකයකුට

**ප්‍රශ්න අංක 05**

**අපේක්ෂණය - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා ඇගයීම.**

**5.** රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු බව ද ඊට සුදුසු ගොඩනැගිල්ලක් ඉදි කළ යුතු බව ද මොණරවිල දිවිත් යෞවන සමාජයේ මාසික රැස්වීමේ දී තීරණය කෙරිණි. යෞවන සමාජයේ ලේකම් වන කුමාර වැලිවත්ත ඔබ යැයි සිතා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සිදුවන සේවය පිළිබඳ ව අවධාරණය කරමින් දැනට ක්‍රීඩා ශාලාව පවතින භූමියේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා අවසර ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.
**(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)** *(ලකුණු 15 යි)*

**නැතහොත්**

සාහිත්‍ය මාසය නිමිති කොටගෙන සෙන්පුර මහා විද්‍යාලයේ වාර්ෂික කලා උළෙල 2011 සැප්තැම්බර් 10 සහ 11 දෙදින පුරා විද්‍යාල භූමියේ දී පැවැත්විණි. [illegible] හා පැරණි සාහිත්‍යයේ වටිනාකම පිළිබඳ විද්වත් දේශන දෙකක් ද විවිධ ප්‍රසංග ද, අධ්‍යාපනික ප්‍රදර්ශනයක් ද ඇතුළු විශේෂාංග රාශියකින් සමන්විත වූ කලා උළෙල අවසන් වූයේ ඒ වෙනුවෙන් පැවැති භාෂා හා සාහිත්‍ය තරගාවලියේ ජයග්‍රාහකයන් හට ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කිරීමෙනි. ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වූ පළාතේ ප්‍රවීණ කලාකරුවකු වූ කේ. බී. වෙද්දගොඩ මහතා සාහිත්‍යය ඉගෙනීමේ වටිනාකම ගැන හරබර දේශනයක් කළේ ය.
ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රාදේශීය වාර්තාකරු ඔබ යැයි සිතා පුවත්පතක පළ කිරීම සඳහා සුදුසු වාර්තාවක් සකස් කරන්න. **(මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)**

*(ලකුණු 15 යි)*

රාජකාරි ලිපිය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි

1. ආකෘතිය සඳහා ලකුණු - 04
2. අන්තර්ගතය සඳහා ලකුණු - 08
3. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු - 03

01. ආකෘතිය සඳහා (ලකුණු 04 යි)

- යවන්නාගේ නම, තනතුර, ලිපිනය සහ දිනය - ලකුණු 01
- ලබන්නාගේ ලිපිනය - ලකුණු 01
- ආමන්ත්‍රණය (මාතෘකාවට පෙර යොදා තිබිය යුතුයි) - ලකුණු 01
- මාතෘකාව සහ අත්සන - ලකුණු 01

(යවන්නාගේ තනතුර යවන්නාගේ ලිපිනය තුළ හෝ ලිපිය අවසානයේ හෝ සඳහන් වී තිබිය යුතුයි.)

02. අන්තර්ගතය සඳහා (ලකුණු 08 යි)

- පුහුණු මධ්‍යස්ථානයක අවශ්‍යතාව - ලකුණු 02
- නව ගොඩනැගිල්ලක අවශ්‍යතාව - ලකුණු 02
- පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමෙන් ඉටුවන සේවය - ලකුණු 02
- අවසර ඉල්ලීම - ලකුණු 02

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

03. ශිල්පීය දක්ෂතා සඳහා (ලකුණු 03 යි)

- නිවැරදි අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ, විරාම ලකුණු, පැහැදිලි අත් අකුරු, උක්ත ආඛ්‍යාත සම්බන්ධය, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

(ලකුණු 15 යි)

පුවත්පත් වාර්තාව

| | |
|---|---|
| 1. ආකෘතිය | - ලකුණු 04 |
| 2. අන්තර්ගතය | - ලකුණු 08 |
| 3. ශිල්පීය දක්ෂතා | - ලකුණු 03 |

1. ආකෘතිය (ලකුණු 04 යි)

| | |
|---|---|
| ➢ ශීර්ෂය | - ලකුණු 02 |
| ➢ වාර්තාකරු | - ලකුණු 01 |
| ➢ වාර්තාවේ ආකර්ෂණීය භාවය | - ලකුණු 01 |

2. අන්තර්ගතය (ලකුණු 08 යි)

- නිමිත්ත
- දිනය
- ස්ථානය
- දේශන දෙකක්
- විවිධ ප්‍රසංග
- අධ්‍යාපනික ප්‍රදර්ශනය
- ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය
- ප්‍රධාන ආරාධිත අමුත්තා කේ.බී. වෛද්‍යනාථ මහතා

3. ශිල්පීය දක්ෂතා (ලකුණු 03 යි)

WWW.OLEVELAPI.COM

නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, ව්‍යාකරණ, විරාම ලකුණු, ඡේද වෙන් කිරීම සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන්න.

- නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

(ලකුණු 15 යි)

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන්ව දී ලකුණු එකතුව ලබාගන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | III | පැය දෙකයි |
| சிங்கள மொழியும் இலக்கியமும் | III | இரண்டு மணித்தியாலங்கள் |
| Sinhala Language and Literature | III | *Two hours* |

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

* 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංක 01**

**අපේක්ෂණය** - **නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම**

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20 යි.**

**මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.**

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ඔසු සැමිං අර කවුද කිව වාගේ කරපු හොඳ පස්සෙන් එනව කියන්නෙ.
 (අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
 (ආ) ඒ හා සබැඳි අවස්ථාව කුමක් ද?

(ii) සමත් බවසා වුවහොත් ඔත් ලවාගෙන කළේව සියව.
 (අ) මෙම ප්‍රකාශය ශ්‍රවණය කළ අය කවරෙක් ද?
 (ආ) 'බවසා' යන්නෙහි අර්ථය ලියන්න.

(iii) එවන මෙසඳ කැටුළිය ලැව් ගිනිසෙ . වලා
 කුමන සැප ද විත්ඳේ ගිම් සමන වලා
 (අ) මෙම කවියේ මුල් පද දෙක සම්පූර්ණ කරන්න.
 (ආ) කළු පාට අකුරෙන් මුද්‍රිත පදවල අදහස වෙන් වෙන් ව ලියන්න.

(iv) කැරලුන් මහෝත්සාහයෙන් විද ගත් සිදුරුවලින් සිරවුන් ප්‍රයෝජන විඳුනා සේ, මා එක් කළ සම්පතින් ප්‍රයෝජන විඳින්නෝ ඔත් බෑණුයාණෝ ය.
 මෙම පාඨයේ සඳහන්,
 (අ) උපමාව, (ආ) උපමේය, වෙන්කොට දක්වන්න.

(v) (අ) සත්තුභත්ත ජාතක කථාව ඇසුරු කරගෙන ලියැවුණු කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?
 (ආ) එම කෘතිය ලිවීම සඳහා ඇරයුම් කරන ලද්දේ කවරකු විසින් ද?

(vi) "එසේ හෙයින් මාරයාවන් වඩා රන්දරුවන් **බිළි** බව නොදනු ද යි ............ "
 (අ) මෙම පාඨය උපුටා ගත් මුල් කෘතිය නම් කරන්න.
 (ආ) කළු පාට අකුරෙන් මුද්‍රිත පදයේ අර්ථය ලියන්න.

(vii) (අ) නාට්‍ය ශාස්ත්‍රය හා කාව්‍ය ශාස්ත්‍රය යන ග්‍රන්ථවලට අනුව නාට්‍යය බෙදී ඇති කොටස් දෙක මොනවා ද?
 (ආ) මහල් ප්‍රශස්තාව නාට්‍යය අයත් වන්නේ මෙයින් කුමන කොටසකට ද?

(viii) (අ) සඳ කිඳුරු දා කව ලියැවී ඇති සාහිත්‍ය යුගය නම් කරන්න.
 (ආ) ප්‍රස්තාවලිය කෘතියේ රචකයා කවරෙක් ද?

(ix) (අ) ඒ.වී. සුරවීර මහතා විසින් රචිත කෙටි කතා සංග්‍රහ **දෙකක** නම් ලියන්න.
 (ආ) දයාසේන ගුණසිංහ මහතා විසින් රචිත කෙටි කතා සංග්‍රහ **දෙකක** නම් ලියන්න.

(x) (අ) යසෝදරාවත හැරුණු විට මහනුවර යුගයේ ලියැවී ඇති කාව්‍ය ග්‍රන්ථ **දෙකක** නම් ලියන්න.
 (ආ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත සංදේශ කාව්‍ය **දෙකක** නම් ලියන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**අපේක්ෂිත උත්තර**

i. (අ) සිරියාවතීගේ මව
(ආ) සිරියාවතීගේ මව සිරියාවතීට පාට පෙට්ටියක් ඉල්ලා ගැනීමට එන්සිනාලාගෙ ගෙදර ගොස් එය නොලැබුණු නිසා ආපසු නිවසට පැමිණ දොස් කියන අවස්ථාව.

ii. (අ) සාකේත නුවර සිටු දේවියට පණිවිඩය ගෙන ආ තැනැත්තාට/තැනැත්තියට/ තැනැත්තන්ට
(ආ) බඩගින්න / කුසගින්න / කුධාව

iii. (අ) හමන සුවඳ සිහිලස ලිය මඬුලු වලා
ගිමන නිබඳ සතපා උනිඳු ලොබ වලා
(ආ) වලා පැතිර ගිය / ව්‍යාප්ත
වලා වනය / වනාන්තරය / කැලය

iv. (අ) උපමාව කැරලුත් මහෝත්සාහයෙන් විද ගත් සිදුරුවලින් ගිරවුන් ප්‍රයෝජන විඳිනා සේ.
උපමේය මා රැස් කළ සම්පතින් ප්‍රයෝජන විඳින්නෝ බත් බැළයාණෝය

v. (අ) කාව්‍යශේඛරය
(ආ) උලකුඩය දේවිය / ලෝකනාථා දේවිය

vi. (අ) සද්ධර්මාලංකාරය
(ආ) බලවත් / බලසම්පන්න / බලයෙන් යුක්ත / ප්‍රබල

vii. (අ) සුඛාන්ත / දුක්ඛාන්ත
(ආ) සුඛාන්ත

viii. (අ) කුරුණෑගල යුගය
(ආ) මයුරපාද පරිවෙණාධිපති බුද්ධ පුත්‍ර හිමි/ මයුරපාද පරිවෙණාධිපති හිමි/ මයුරපාද පරිවේණාධිපති.

ix. (අ) ගෙදුරු ලොබ, පැදි දියට බොර දිය, කාටත් මා එපා වෙලා, බව කිමිර
(ආ) කේතුමතී හෝටලයේ රාත්‍රියක්, කැනල් පාරේ නිශාචරයෝ

x. (අ) වදන් කවි පොත, තුන් සරණ වෙසතුරු දා කව, සොකරි කවි කතාව, ගණදෙවි හැල්ල,
(ආ) සැළලිහිණි සංදේශය, පරෙවි සංදේශය

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**ප්‍රශ්න අංක 02**

| | | |
|---|---|---|
| අපේක්ෂණය | 1. | නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය |
| | 2. | පාඨයක අදහස තම බසින් ලියා දැක්වීමේ කුසලතාව ඇගයීම |
| ලකුණු විග්‍රහය | - | ප්‍රශ්නයකට හිමි මුළු ලකුණු 20 යි. (එක් කොටසකට ලකුණු 05 බැගින්) |

තද කළු අකුරින් ඇති එක් එක් වචනයට නිවැරදිව තේරුම් ලියා ඇත්නම් එක වචනයකට

| | | |
|---|---|---|
| ලකුණු 01 බැගින් | - | ලකුණු 02 යි |
| සමස්ත අර්ථයට | - | ලකුණු 03 යි |

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) බත් බැලයා මා නිල කළ සම්පත **ධරා ලිය නොහෙන** නියා ය. රජ වූවන් ඒ නිසා **කොක්සන් ගසන** නියා යයි සිතා එපවත් දන්නා පිණිස මිනිසුන් එවූ ය.

(ii) එසේ හෙයින් **බන්ධනයෙහි වැදහෙව** දුක් අනුභව කිරීමෙන් මට ප්‍රයෝජන කිම් ද? **මන්ත්‍රය පිරුවා** සත්රුවන් වර්ෂා වස්වා සොරුන්ට වස්තු දී සැප සේ යෙමි.

(iii) කොල්ලන් කෙල්ලන් පොබයන්නී
මිහලු සිතෙන් **කෙළි වශී** ලන්නී.
ගෙයි ගෙයි **බත් වෙස්** ගන්වන්නී.
අවුරුදු කිරි බත උයවන්නී.

(iv) රසඳුන් නුවනැඳ
මුලසින් **රඟොරි** පසඳ
අත් කවුතුක බැඳ
සඳ **පෝමින් විසර** එළඳ

(ලකුණු 05 × 04 = 20 යි)

**අපේක්ෂිත උත්තර**

02.

i. ධාරා ලිය නොහෙන - දරාගත නොහැකිව / දරා ගැනීමට අසමත්ව / උසුලා ගත නොහැකිව / ඔරොත්තු දෙන්න නොහැකිව / පාලනය කරගත නොහැකිව

කොක්සන් ගසන - මහත් හඬින් සිනාසෙන / කොකුන් වගේ කෑ ගසන / මහ හඬින් කෑ ගසන / කොක් හඬලා සිනාසෙන

බත් බැලයා මා නියම් කළ සම්පත් දරා ගත නොහැකිවා වැනිය. එම නිසා රජවූ පිරිස මහ හඬින් කෑ ගසන්නේ යයි සිතා ඒ බව දැනගැනීම පිණිස මිනිසුන් යැවුය.

ii. බන්ධනයෙහි වැද හෙව - බැඳීම්වලින් / බැම්මවලින් බැඳ / සිර භාරයට පත්ව / සිරකරුවකු වී / ලොකු දුකකට පත්ව / හිරගෙයක ලා

මන්ත්‍රය පිරුවා - මන්ත්‍රය සම්පූර්ණයෙන් කියා / මන්ත්‍රය ජපකර / මන්ත්‍රය මතුරා

එම නිසා බැම්මවලින් බැඳ දුක් විඳීමෙන් මට ප්‍රයෝජනය කුමක්ද ? මන්ත්‍රය ජපකර සත් රුවන් වර්ෂාව වස්සවා සොරුන්ට එම වස්තුව දී මම. සැප සේ යමි.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

iii. කෙළි රිසි - ක්‍රීඩාවට කැමති / සෙල්ලමට කැමති / ක්‍රීඩාවට ආසාව ඇති.
බක් වෙස් - බක් මාසයේ ස්වරූපය / අවුරුදු අසිරිය / අප්‍රේල් මාසයේ සිරිය

තරුණ තරුණියන් අතර ප්‍රබෝධවත් ගතියක් ඇතිකරවයි / මහලු අය තුළ ද ක්‍රීඩාවට කැමති බවක් ඇති කරවයි. ගෙයක් ගෙයක් පාසා අවුරුදු අසිරිය දක්නට ලැබෙයි. අවුරුද්ද උදාවත්ම කිරි බත උයවයි.

iv. රතොට පහදා - තොල් රතුපාට කරවා / තොල් රතු කර
පෝමින් - ශක්ති ප්‍රමාණයෙන් / හැකි පමණින් / පොහොසත් පමණින්

ඇස්වල රසාංජනයන් ගල්වා බුලත්වලින් තොල් රතුපාට කරවා විවාහයේ දී මනාලියගේ අතෙහි බදින නූලක් බැඳ තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් කාන්තාව සරසණු ලැබිය.

**ප්‍රශ්න අංක 03 - 07 තෙක්**

**අපේක්ෂණය** — **අගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව අගයීමට ලක් කිරීම.**

**ලකුණු විග්‍රහය** — **3, 4 ප්‍රශ්න අනිවාර්යයි** **ලකුණු 15 යි**
**5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුය.** **ලකුණු 10 යි**

**3, 4 ප්‍රශ්නවල තෝරා ගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන් ව විස්තර සහිතව ලියා තිබිය යුතුය. උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු දෙන්න.**

| | | | |
|---|---|---|---|
| **උදාහරණ 04 ට** | - | **ලකුණු 04** | **ලකුණු 15 යි.** |
| **සමස්ත විස්තරයට** | - | **ලකුණු 11** | |

**ප්‍රශ්න අංක 03**

3. "පොළොවේ තුහරයෙන් පැමිණි මිනිසා" කෙටි කතාවෙහි,
(i) ධනවත් සමාජයේ හරසුන් බවත්
(ii) දිළිඳු සමාජයේ අවාසනාවත්
මනාව පැහැදිලි වන අයුරින් චරිත හසුරුවා ගැනීමට කතුවරයා සමත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

**අපේක්ෂිත උත්තරය**

i. (i) ධනවත් සමාජයෙහි හරසුන් බව :-
කථා නායකයාගේ (බාබුජී) හෝ ඔහුගේ මවගේ හෝ චරිත හසුරුවා ඇති ආකාරය පිළිබඳව අදාළ කරුණු දෙකක්වත් දක්වා තිබීම.
බාබුජීගේ චරිතය - මාන්නක්කාර බව, මුදල් පිළිබඳ ඉහළින් සිතීම.
බාබුජීගේ මෑණියන් රාසුල්ව දුටු ආකාරය. - දිළින්දන් කෙරේ පෙළන අකාරුණික බව, අන්ධ ආගමික විශ්වාසය.

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

(ii) දිළිඳු සමාජයේ අවභාජත්වය :-

රාහුල්පුතේ චරිතය නිරූපණය වන විවිධ අවස්ථාවලින් දෙකක්වත් දක්වා තිබීම.
ප්‍රියමනාප බව, අවංක බව, අනුන්ට උදවු කිරීමට ඇති කැමැත්ත, උගතෙකු නොවුවත් ගුණවත් බව, මුදලට වඩා මිනිස්කම අගය කරන බව.

(උදාහරණ දක්වමින් මෙම කරුණු විස්තර කර තිබිය යුතුය.)

උදාහරණ සඳහා ලකුණු - 04
සමස්ත විස්තරයට ලකුණු - 11
(මුළු ලකුණු 15 යි.)

**සැසෙයාත්**

**මඟුල් ගිය / වසන්ත සමය පැදිපෙළ රසවත් කාව්‍ය නිර්මාණයක් වී ඇත්තේ,**

**(i) උචිත කාව්‍යෝපක්‍රම භාවිත කිරීම**

**(ii) ස්වභාව සෞන්දර්යය මැනවින් වර්ණනයට ලක් කිරීම**
**යන කරුණු නිසා ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.** *(ලකුණු 15 යි)*

**අපේක්ෂිත උත්තරය**

ii. (i) උචිත කාව්‍යෝපක්‍රම භාවිත කිරීම

- ➢ සාධනීය ආකාශීය තුළින් සජීවී බව ඇති කිරීම.
  ශබ්දධ්වනි, අනුප්‍රාසය, චිරිත, එළිසමය

- ➢ රූපක
  සිසිර කුමරි, දිනිසුරු කුමරු, ලෝ කත

(ii) ස්වාභාව සෞන්දර්යය මැනවින් වර්ණනයට ලක් කිරීම.

- ➢ ස්වාභාව සෞන්දර්යයේ දක්නට ලැබෙන වස්තූන් විචිත්‍ර ආකාරයෙන් ඉදිරිපත් කිරීම
  ගස්, මල්, මී මැස්සන්, පක්ෂීන්, පලතුරු ආදිය

- ➢ ස්වාභාව සෞන්දර්යයට සජීවී බවක් ආරෝපණය කිරීම.

(උදාහරණ දක්වමින් මෙම කරුණු විස්තර කර තිබිය යුතුය.)

උදාහරණ සඳහා - ලකුණු 04
සමස්ත විස්තරයට - ලකුණු 11
(මුළු ලකුණු 15 යි.)

මෙම උදාහරණය හෝ වෙනත් උචිත කරුණු දක්වා ඇත්නම් අදාළ ලකුණු දෙන්න.

W W W . O L E V E L A P I . C O M

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## ප්‍රශ්න අංක 04

4. සඳකිඳුරු ද කාව්‍යය වඩාත් සාර්ථක වී ඇත්තේ,
   (i) කිඳුරු යුවළගේ සුන්දර ජීවිතයත්,
   (ii) කිඳුරාගේ වියොවින් තැවෙන කිඳුරිය නගන ශෝකාලාපයත්,
   මැනවින් සුසංයෝග කරමින් පද්‍ය නිර්මාණය වී ඇති නිසා ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

### අපේක්ෂිත උත්තරය

i. <u>කිඳුරු යුවළගේ සුන්දර ජීවිතය</u>

මේ කවි පෙළෙහි බොහෝ කවිවල මුල් දෙපදයෙන් විස්තර වනුයේ කිඳුරු යුවළගේ සුන්දර දිවියයි.

උදා :- උපුල් කඩාගෙනෑ කනලා සුපුල් වන
ලකල් කුසුම් දම් කරලා එකල් වන

මේ සඳහා උචිත කවි පද යොදාගෙන විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.

ii. <u>කිඳුරිය නගන ශෝකාලාපය</u>

එම කවිවලම අවසන් පද දෙකෙන් විස්තර වන්නේ කිඳුරාගේ වියෝවෙන් තැවෙන කිඳුරිය නගන ශෝකාලාපයයි. එබැවින් උචිත කවිපද ලියා විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.

උදා :- නිමල් මෙතුඹ සහ විඳි සැප විපුල් වන
සිසිල් සෙවන උන් මට මේ තැවුල් වන

මේ ආකාරයට අවස්ථා දෙක සුසංයෝග කර ඇති අයුරු දක්වෙන කවිවලින් උදාහරණ දක්වා තිබීම අවශ්‍යය.

උදාහරණ සඳහා ලකුණු 04
සමස්ත විස්තරයට ලකුණු 11
(මුළු ලකුණු 15 යි)

WWW.OLEVELAPI.COM

ගැහැනොත්

සද්ධර්මරත්නාවලි කතුවරයා සතු ප්‍රතිභාපූර්ණත්වය මැනවින් විදහා දක්වෙන්නේ,
(i) කතාවේ සංසිද්ධීන්ට උචිත ලෙස චරිත හැසිරවීම
(ii) මනා ලෙස භාෂාව හැසිරවීම
යන කුසලතා නිසා ය. නියමිත කොටසින් උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

### අපේක්ෂිත උත්තරය

i. සංසිද්ධීන්ට උචිත ලෙස චරිත හැසිරවීම.

- ගන්ධක සිටාණන්ගේ චරිතය
  ගන්ධක සිටාණන් හා භාණ්ඩාගාරික ලේකම් අතර ඇතිවන කතා බහ.
- ධනය පරිභෝජනය කර අවසන් කිරීමට සිතූ සිටාණන් ඒ සඳහා බත් කන මණ්ඩපයක් ඉදි කිරීමට වියදම් කිරීම.
- පිටිසර වැසියාට බත් දීමට අකමැති වීම.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

බත් බැළයාගේ චරිතය

- ගන්ධක සිටාණන්ගේ බත් තළියෙන් බත් පිඩක් කෑමට ආශාවක් ඇති වීම.
  ''තෙල බත් තළියෙන් බත් පිඩකට ආශා ඇති වී ය' යි කීවුය.
- ''සබඳ ඒ නොලදිම් නම් ජීවත් විය නො හෙමි''
- ''සිටාණන් දිලන්ට මැළියාසේම මමත් ආලය හැරගන්නට මැළියෙමි. නොලදොත් මියෙමි''
- ''සබඳ යහපතියි කියා ලා අඹුදරුවනුත් හැර එක බත් තළිය වුවත්......''
- බත් තළිය දන් දීම.
  ''පෙර මා දනක් දී ලිය නුහුණු හෙයින් එක බත් තළියක් නිසා තුන් හවුරුද්දක්......''
- ''ස්වාමීනි මේ එක් කෙනෙකුට ඉත් වඩා නොසෑහෙන බත දෙභාග කරන්නට බැරිය.''

ii. මනාලෙස භාෂාව හැසිර වීම.

- පොදුජන වහර
  ''ස්වාමීනි මෙතෙක් වස්තු තුඹගේ දෙමවුපියන් සන්තක දෙය ය''
  ''තුලුන්ව දුන් නියා බලා යම් යම් කෙනෙක් ඉල්වූ නම් උන් උන්ට දෙන කලට අප අනුභව කරන්නේ කිමද ?''
- උපමා භාවිතය
  ''දකුණු මුහුද ගමන් ගත් නැවක් මෙන්''
  ''කොට නිමි වොටුන්නේ ඔබන මැණිකක් මෙන්''
  ''පෙර දෙපෝයේ සඳ පරිද්දෙන්''
- සංවාදශීලි බස සජීවි ලෙස යොදා ගැනීම
  - නගර වැසියා හා ගන්ධක සිටාණන් අතර ඇති වූ සංවාදය
  - භාණ්ඩාගාරික ලේකම් හා සිටාණන් අතර සංවාදය
- අවස්ථාවෝචිත ව බස් වහර යොදා ගැනීම
  - කෙටි වැකි භාවිතය
  - දිගු වැකි භාවිතය

WWW.OLEVELAPI.COM

උදාහරණ සඳහා ලකුණු 04
සමස්ත විස්තරයට ලකුණු 11
(මුළු ලකුණු 15 යි)

**ප්‍රශ්න අංක 05**

5. 'පූරාවලිය කතුවරයා පාඨක සිත් ඇද ගන්නා ආකාරයෙන් කතා ලිවීමෙහි හැකියාවක් ඇති අයෙකි' නියමිත කොටසින් උදාහරණ තුනක් දක්වමින් මෙම කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත උත්තරය**

i. කුතුහලය දනවන අයුරින් අවස්ථාව ඉදිරිපත් කිරීම

- දිසාපාමොක් ආචාරීන් ළඟට ශිල්ප ලබා ගැනීමට යන අවස්ථාවේ තමා හැඳින්වා දුන් ආකාරය

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

- ''ආචාරි ''කෙපි කවුරුද?'' යි විචාල කල අනිකක් කීම් නම් මා කෙරෙහි නොකරති' යි සිතා......''
- ''ආචාරි භාගය ගෙනවුද?' යි.....
  දෙමව්පියන්ට නොකියා ශිල්ප ලෝභයෙන් හොරා අයිමි......''

ii. ජීවක වෛද්‍යාචාර්යවරයා කළ විවිධ පිළියම් ආශ්‍රයෙන් විශ්වසනීයත්වය ගොඩ නැගෙන ආකාරයෙන් කරුණු ඉදිරිපත් කිරීම.

- රජ, සිටුවරුන් වැනි ප්‍රභූන්ගේ රෝග සුව කිරීම.
- රෝගීන්ගෙන් ප්‍රශ්න අසන ආකාරය

මන්රලුංගභෝජක නම් පණුවන් දෙදෙනකු ඇති බව පවසා ප්‍රතිකාරයට මාස 21 ක් දින නියම කර දවස් 21 කින් සුව කිරීම.

iii. භාෂා උපක්‍රම :- කෙටි වැකි මගින් පාඨක සිත් ග්‍රහණය කර ගැනීම.

උදා :-

- මාගේ කිසි නෑසිය කෙනෙකුත් නැත, මතු මට හිමිවන කුල සැපතෙකුදු නැත,
- වෛද්‍ය ශාස්ත්‍රය නම් දතුවාහට මොලොවත් වැඩ වෙයි. පරලොවත් වැඩ වෙයි. පින් වෙයි.

iv. අවස්ථා නිරූපණය

උදා :

- අපි සත්හිඳුවම්හ අපි සත්හිඳුවම්හයි වාසි කිය කියා.....
- පිටාණන්ගේ ගෙට අපි අපි යයි වාසි කිය කියා මුළු බැඳ එන.....

v. උපාමා යෙදීම

- ඉස්මුල් සැත් ලාලා ලියා හරණා සේ
- මාගේ නුවර නැගූ ධ්වජයක් සේ
- අමා දිය ලද්දවන් සේ

WWW.OLEVELAPI.COM

උදාහරණ සඳහා ලකුණු 03
සමස්ත විස්තරයට ලකුණු 07
(මුළු ලකුණු 10 යි)

**මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන කරුණු ඉදිරිපත් කර ඇත්නම් අදාළ ලකුණු දෙන්න.**

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**ප්‍රශ්න අංක 06**

6. පවතින සමාජ අසාධාරණය හමුවේ දිළිඳු දරුවකු මුහුණ දෙන ශෝචනීය අත්දැකීම් දැඩි සංයමයකින් යුතුව කවියට නැඟුණු අවස්ථාවක් ලෙස 'පියසේන ඇසූ ප්‍රශ්නයක්' යන පැදිපෙළ අගය කළ හැකි ය. උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත උත්තරය**

06. සම වයසේ ළමයින් දෙදෙනෙකුගේ සමාජ පරතරය නිරූපණය කරන ආකාරය දක්විය යුතුය.

පියසේනගේ අරමුණ පුංචි බේබිත් සමග පාසල් ගොස් අධ්‍යාපනය ලැබීම, පියසේන සුදුසුකම් ලබා දෙකේ පංතියෙන් තුනේ පංතියට සමත් වීම පාඨකයා තුළ ද්වේෂයක්, වෛරයක් සමාජයට එල්ල නොවන අයුරින් ඉතා සංයමයෙන් යුතුව කවියා තම අදහස් ඉදිරිපත් කර ඇති ආකාරය දක්වා තිබිය යුතුය.

පියසේනගේ ප්‍රශ්නය පාඨකයාට විසඳීම සඳහා ඉදිරිපත් කර ඇති ආකාරය - ආදිය පිළිතුරට ඇතුළත් විය යුතුය.

**ඉහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් උදාහරණ 3 ක් වත් විස්තර කර ඇත්නම් ඉහළ ලකුණක් ප්‍රදානය කරන්න. පොතේ උපුටන ඒ ආකාරයෙන්ම නැතත් විස්තර කර ඇත්නම් ලකුණු පිරිනමන්න.**

| | |
|---|---|
| **උදාහරණ අවස්ථා සඳහා** | **ලකුණු 03 යි** |
| **සමස්ත විස්තරයට** | **ලකුණු 07 යි** |

**(එකතුව ලකුණු 10 යි)**

**ප්‍රශ්න අංක 07**

7. නාට්‍යෝචිත අවස්ථා බහුල වන ආකාරයට සිද්ධි ගැළපීම මගින් නාට්‍යයේ අවසානය දක්වා ම ප්‍රේක්ෂකයා ඇද, බැඳ තබා ගැනීමට 'මහුල් ප්‍රස්තාව' නාට්‍ය රචකයා සමත් වී ඇත. නාට්‍යයේ පෙළ ඇසුරෙන් උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත උත්තරය** WWW.OLEVELAPI.COM

07. ලව්නේරිස් තෙපානිස් ගේ ගෙදරට පැමිණීම එහිදී ඇතිවන සතා බත තුළින් ඇතිවන කුතුහලය.

- ආ ළමයා..... කවුද ? මේ ඇත්තට ඔ ? ලව්නේරිස් නේද ?
- අද මොකද මේ හැටි උජාරුවට මේ ළමයා ඇඳ පැලඳ ගෙන එහෙම ?
- පුතා මම කොච්චර සන්තෝස ද ?
- තෙපානිස් ලව්නේරිස්ගේ යෝජනාව ගැන නන්දාවතීට නොපැවසීම
- "නෑන්දා කිව්වෙ බඩු වගයක් ගන්න කවුදෝ මුදලාලි කෙනෙක් ඇවිල්ලා ඉන්නවයි කියලා"
- විවිධ ආරවුල් ඇති කර තර්ක කර ගැනීම
- ගෝන ගේනව , හදයා සහ වල්ලියාට වැනි නාට්‍යෝචිත අවස්ථා සඳහා උචිත උදාහරණ දක්වමින් විස්තර කර තිබිය යුතුය.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...